# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුමිය!
Mother and Motherland are nobler than Heaven

FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි

VOLUME 11
NUMBER 03

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

JUNE 10, 2008 ජුනි මාසය (බුද්ධ වර්ෂ 2552 පොසොන් මාසය)


# පොසොන් සංස්කෘතික පිබිදීම!



චිත්‍රය - තලන්ගම ජයසිංහ *Art* - Talangama Jayasinghe - *Sri Lanka*


***සංජය විමලරත්න විසිනි***


**මේ** පොසොන් මාසයයි. මෙය ශ්‍රී ලංකාවට වෙසක් මෙන්ම සුවිශේෂ පොහොයක් වෙයි. මන්ද, දැනට වසර **2316** කට පෙර මිහිඳු මා හිමියන් විසින් නිර්මල බුද්ධ ධර්මය අප දේශයට ගෙන එනු ලැබුවේ පොසොන් පොහෝ දිනක බැවිනි.

එදා මිහිඳු හිමියන් අපට දුන් බෞද්ධ දර්ශනය අද දක්වාම අප ජනතාවට ආගමික මෙන්ම අධ්‍යාත්මික ශක්තිය ගෙන දෙමින් පවතියි. ඒ අවධියේ අශෝක අධිරාජයා යටතේ වූ භාරතය සහ ලංකාව අතර තිබුණු සහ මහින්දාගමනයෙන් අළුත්වූ කිට්ටු සබඳතාව රටේ ප්‍රබල සංස්කෘතික පිබිදීමකට තුඩු දිණ. මෙයට පෙර විජයාවතරණය සමග ඇරඹී තිබුණු අප ශිෂ්ඨාචාරය මේ සංස්කෘතික පිබිදීමත් සමග ඔප වැටෙමින් තව ඉදිරියට ගියේ ය.

මිහිඳු මා හිමියන් අපට දෙසූ ධර්මය වැනි ගැඹුරු දර්ශනයක් අවබෝධ කර ගැන්මට එදා අප ජනතාවට හැකිවූවා සේම ඒ සමග සහ එයට පසු භාරතයෙන් ආ වාරිමාර්ග සහ ගෘහ නිර්මාණ ශිල්ප, කෘෂිකාර්මික සහ කාර්මික ශිල්ප, සෞන්දර්ය හා විවිධ කලාශිල්ප ආදිය ද ඒ ආකාරයටම තේරුම්ගෙන උකහාගැන්මට අප ජනතාව ශූර වූහ. ඒ සමගම එම වර්ධනයේ තවත් සුවිශේෂ ලක්ෂණයක් ද විය. එනම් භාරතයෙන් ලද එම දායාදයන් ඒ ලෙසටම අනුකරණය හෙවත් කොපිකිරීමක් නොව, ඒවායේ හරය හා වැදගත් ලක්ෂණ අවබෝධ කරගෙන ඒ මත අපේම සංස්කෘතියක් ශිෂ්ඨාචාරයක් අප ජනතාවට නිර්මාණය කරගැන්මට හැකිවීමය. අනුරාධපුර, පොළොන්නරු, සීගිරි, කලාවැව ආදී එම යුගවලට අයත් නටබුන්වල ඇති, අද පවා පිටරට වලින් එන දක්ෂ කාර්මික ශිල්පීන් පවා මවිතකරවන, එදා හෙළයාගේ එම නිර්මාණයන් මේ නව පිබිදීම ගැන සාක්ෂි වෙති.

## කෘෂි-ග්‍රාමීය ශිෂ්ඨාචාරයක්
## Agro - Rural Civilization

මෙසේ කෘෂිකර්මය තුළින් ගොඩනැගුණු ග්‍රාමීය පදනමකින් යුත් ශිෂ්ඨාචාරයක් මත එදා අප සිංහළ සමාජය දියුණුවන්නට විය. එයට පසුව වසර දෙදහසක් පමණ කාලයක් අප රට පැවතියේද, අද ද පදනම්ව ඇත්තේ මේ ශිෂ්ඨාචාරය මතය. වැව-ගම-දාගැබ යනුවෙන් පිළිබිඹු කරනුයේ ද මෙම සංකල්පයයි. පදනමයි. රටේ ස්වභාවික පිහිටීම අනුව භූගෝලීය සහ දේශගුණික ලක්ෂණ උපයෝගීකර හසුරුවමින්, උපරිම ප්‍රයෝජනයට ගන්නා අපටම අනන්‍ය වූ, ද්‍රාව ශිෂ්ඨාචාරයක් **(a unique hydraulic civilization)** එසේ ගොඩනැගිණ. එසේම එය මුළු රටේම විහිදිණ. පසු කාලයක සොලී ආදී සතුරු ආක්‍රමණ නිසා ජනතාව සිය ගම්බිම් අතැර දකුණු ප්‍රදේශවලට සංක්‍රමණය වුවද, එසේම එයට පසු ඇතිවූ පෘතුගීසි, ලන්දේශි හා ඉංග්‍රීසි ආදී බට හිර සතුරු ආක්‍රමණ ආදියට මුහුණ දීමට ද, එම බලපෑම්වලට යට නොවී අනන්‍යතාවක් ඇතිව අද ද නොසැලී සිටින්නට අප ජනතාවට හැකියාව ලැබුණේ මේ **වැව - ගම - දාගැබ** යන තුන් සංකල්ප එකතුව මත ගොඩනැගුණු ඒ **කෘෂි-ග්‍රාමීය** පදනමේ ශක්තියෙනි. මේ ග්‍රාමීය ශිෂ්ඨාචාරයත්, මිහිඳු හිමියන්ගෙන් ඇරඹී අප ලද බොදු අධ්‍යාත්මික පදනමත් එසේ නොසැලී සිටින්නට අපට ශක්තිය දුන් බල කුළුණු දෙක වූහ.

## රටේ ඉදිරි දර්ශනය
## The vision for the way forward

මැයි මාසයේ අප ජනාධිපතිතුමා ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාල ශාලාවේ පැවත්වූ දේශනයේ තේමාව වූයේද අප රටේ ඉදිරි දියුණු අරභයා ග්‍රාමීය පදනම ප්‍රබලකරලීමේ සංවර්ධන උපක්‍රමය යන්නයි.

**(The empowerment of the rural economy as a development strategy for Sri Lanka)**

අවුරුදු දෙදහසකට වඩා පැරණි අප ශිෂ්ඨාචාරය පිළිබිඹුකරන නටබුන් අතර වෙන රටවල වාගේ රජවරුන්ගේ මහා මාළිගා, කොටු බැමි වලින් පිරී නැත. අප පැරණි රජදරුවන් එවැනි දේ ගොඩනැගීම වෙනුවට කළේ මහාවැව් වාරිමාර්ග ක්‍රම ආදිය සකසා ජනතාව සුබිත මුදිත කිරීමේ කටයුතු ය. මුහුදු වැනි විශාල වැව් ගොඩනැගීමය. රටේ භූමි ප්‍රමාණයෙන් විශාලම පළාත් තුනක විහිදී ඇති, අද පවා ක්‍රියාත්මකව පවතින මහා වැව් රාශිය සහ ඒවායින් පෝෂණය වන කුඹුරු සහ ගම් මෙයට කදිම නිදසුන් ය.

මෙවැනි ද්‍රාව ශිෂ්ඨාචාරයක් තුළ ගොඩනැගුණු අප ගම්, නියම්ගම් වල අප මුළු ජනගහනයෙන් 77% ටත් වඩා අදද ජීවත්වෙති. බුදුදහමේ දර්ශනයෙන් අපට ඉගැන්වූයේ මේ ලොව තාවකාලිකව ජීවත්වන සුළු කාලය තුළ අප වටා ඇති වනාන්තර ඇළ, දොල, ගංගා, මුහුදු සහ වායුගෝලයෙන් සමන්විත අප පරිසරය අපට සදාකල් සින්න වූවා නොව එය මනාව පරිහරණය කොට අනාගත පරම්පරාවනට ඒ අයුරින්ම


**5 වන පිටුව බලන්න** →


අසමින් මිහිඳු හිමි දෙසූ බුදු දහම් පද
නිරිඳුන් දැහැමි වුණි හිමි පද බැතින් වැඳ
දිවමන් එසිරි දුටු මතකය සිතින් විඳ
දිදුලන් නේය අද ලක'ඹර පොසොන් සඳ

♦ *දයා ආනන්ද රණසිංහ*



ලංකාවිත්ති වෙබ් අඩවිය Lanka Viththi Website
http://www. lankaheritage.com/lankaviththi/




ලොවපුරා මුදල් යැවීම සඳහා
එකම විශ්වාසවන්ත නාමය

MCG
FAST CASH
SEND TODAY - COLLECT TODAY

විස්තර පිටු අංක 3